# සත්ත්ව පාලනය සමග

# ඒකාබද්ධ ගොවිපළ පාලනය මගින් ඵලදායිතාව වැඩි කිරීම

"අපි වවමු - රට නගමු" සංකල්පය යටතේ ශ්‍රී ලංකාවේ ඉඩ-කඩ පවතින සෑම බිම් අඟලකම වගා කිරීමට කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් තීරණය කර ඇත. මෙවැනි වගා සංකල්පයන් තුළින් තම පවුලේ ආර්ථිකය, සමාජ මට්ටම, පෝෂණ මට්ටම ඉහළ නංවා ගනිමින් රටේ ආර්ථික සංවර්ධනය ඉහළ නැංවීමට පියවර ගත හැකිය.

ඒකාබද්ධ ගොවිපොළ පාලනය යන සංකල්පයට අනුව භෝග වගාව සිදු කිරීම මගින් ගොවීන් අපේක්ෂා කරන මට්ටමටත් වඩා ගොවීන්ගේ ආදායම ඉහළ නැංවීමේ හැකියාව පවතී.

ඒකාබද්ධ ගොවිපොළ පාලනය යනු සත්ත්ව පාලනය හා භෝග වගාව ගොවිපොළක් තුළ ඒකාබද්ධව සිදු කිරීමයි. මෙහි දී, සත්ත්ව පාලනයට අවශ්‍ය සත්ත්ව ආහාර, භෝග වගාව මගිනුත්, භෝග වගාවට අවශ්‍ය පොහොර, සතුන්ගේ අපද්‍රව්‍ය මගිනුත් සපයා ගත හැකිය. මෙම ගොවිපොළ පාලන ක්‍රමය, සත්ත්ව පාලනය සහ භෝග වගාව යන දෙපාර්ශවයට වාසි ගෙන දෙන ක්‍රමයකි. ඒකාබද්ධ ගොවිපොළ පාලනයේ දී කාබනික පොහොර භාවිතා කිරීම සිදු කරයි. මෙම කාබනික පොහොර නිෂ්පාදනයේ දී සතුන්ගේ අපද්‍රව්‍ය සහ ශාක අපද්‍රව්‍ය ද යොදා ගත හැකිය. මෙම ක්‍රමයේ දී ගොවිපොළ තුළ ඇති සියලුම සම්පත් ආර්ථිකව වාසිදායක ලෙස යොදා ගැනීම සිදු කරනු ලබයි.

වත්මන් වගා රටාවේ දී වැඩි වශයෙන් අකාබනික පොහොර හා කෘෂි රසායනික ද්‍රව්‍ය යොදා ගැනීම සිදු කරයි. අකාබනික පොහොර යෙදීමේ දී ගොවීන් නයිට්‍රජන් අඩංගු පොහොර (යූරියා) යොදයි. මෙම අකාබනික (රසායනික) පොහොර වැඩියෙන් යෙදීමේ දී අස්වැන්නත් ඊට සමගාමීව ඉහළ යන බව ගොවීන් වැඩි දෙනෙකුගේ මතයයි. මෙහිදී රසායනික පොහොර දිගින් දිගටම යෙදීම මගින් පසේ ගුණාත්මක බව අඩු වේ.

පසට නයිට්‍රජන් අඩංගු පොහොර යෙදීමේ දී පස තුළ නයිට්‍රේට් අයන සෑදේ. ශාක වලට අවශ්‍ය ප්‍රමාණයට නයිට්‍රජන් උරා ගැනීමෙන් පසුව ඉතිරි වන නයිට්‍රජන් සෘණ ආරෝපිත නයිට්‍රේට් වේ. මෙම සෘණ ආරෝපිත නයිට්‍රේට සෘණ ආරෝපිත පසට උරා ගැනීමක් සිදු නොවේ. මෙම සෘණ ආරෝපිත නයිට්‍රේට් පස තුළට ගලා ගොස් භූගත ජලයට එක් වීම සිදු වේ. මෙමගින් වගා බිම් ආශ්‍රිතව ඇති ජල ප්‍රභව දූෂණය වීම සිදු වේ. මේ නිසා ජලය බීමට ගැනීමට සුදුසු තත්වයේ නොපවතී.

ඒකාබද්ධ ගොවිපළ පාලනයේ මූලික අවශ්‍යතාවය වන්නේ ගොවිපළින් ලැබෙන ලාභ ඉහළ නැංවීමයි. ඒ සඳහා ශ්‍රී ලංකාවේ විවිධ පළාත්වල වෙසෙන ගොවීන් ඔවුනට ගැළපෙන පරිදි, එමෙන් ම, දේශගුණයට ගැළපෙන පරිදි සතුන් සහ භෝග තෝරාගත යුතුය.

භෝග වගාව සහ සත්ත්ව පාලනය ඒකාබද්ධව සිදු කිරීමේ දී එය ලාභදායීව පවත්වාගෙන යාමට පහත සඳහන් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තමන් සතු විය යුතු වේ.

**සත්ත්ව පාලනයේ දී,**

- ගොවියා විසින් තෝරා ගත යුතු සතුන් වර්ග මොනවාද?
  (උදා:- ගව පාලනය, එළු පාලනය, කුකුල් ආදී)
- එම සතුන් අදාළ දේශගුණික කලාපවලට ගැළපේ ද?
- කුමන සත්ත්ව සම්මිශ්‍රණයක් මේ සඳහා යොදාගත යුතු ද?
- සතුන් හට ආහාර ලබා දෙන්නේ කෙසේ ද?
- සතුන් පාලනය සිදු කරන්නේ කෙසේ ද?
- සත්ත්ව නිෂ්පාදන වෙළඳපොළට ගෙන එන්නේ කවදා ද?

### භෝග වගාවේ දී

- වගා කරන භෝග
- වගා කළ යුතු කාලය
- වෙළඳපළට දැමිය යුතු කාලය
- අවශ්‍ය ශ්‍රමය
- ගොවිපොළ පසේ ස්වභාවය හා පසේ සාරවත් බව
- ගොවිපළ පිහිටි භූමියේ ස්වභාවය
- වල් පැළෑටි සහ ලෙඩ රෝග පාලනය

ශ්‍රී ලංකාවේ විවිධ දේශගුණික කලාප අනුව ඇති කරන සතුන් හා වගා කරන භෝග වෙනස් වේ. ඒ අනුව පවතින ඉඩම්වලින් උපරිම ඵලදායිතාවයක් ලබා ගැනීමටත්, වැඩි ලාභයක් ලබා ගැනීමටත් ඒකාබද්ධ ගොවිපළ පාලනය සිදු කිරීම ඉතා වැදගත් වේ.

ඒකාබද්ධ ගොවිපල පාලනයේදී, සත්ත්ව පාලනයට යොදා ගන්නා සතුන් හට අවශ්‍ය ආහාර භෝග වගාව ආශ්‍රිතව තරමක් දුරට හෝ සපයා ගත හැකි ආකාරයට වගාව සඳහා භෝග තීරණය කල යුතුය.

"අපි වවමු - රට නගමු" යන තේමාව යටතේ ක්‍රියාත්මක වන දේශීය ආහාර නිෂ්පාදනය ඉහළ නැංවීමේ වැඩසටහනට සමගාමීව විවිධ අරමුණු සහ ඉලක්ක ඇත. මෙම ලිපිය මඟින් ප්‍රධාන වශයෙන් ඒකාබද්ධ ගොවිපළ පාලනය යොදා ගනිමින් එවන් අරමුණු පහසුවෙන් ළඟාකර ගන්නා ආකාරය ලියැවේ.

i. අත්‍යවශ්‍ය ආහාර භෝග නිෂ්පාදනය කිරීම.
ii. ජනතාවගේ පාරිභෝජන රටාව දියුණු කිරීම.
iii. ආහාර ආනයනය සඳහා වාර්ෂිකව වැය වන විදේශ විනිමය පහත හෙළීම.
iv. කාබනික පොහොර භාවිතය දිරි ගැන්වීම තුළින් ඉදිරි වසර 3 තුළ දී රසායනික පොහොර ආනයනය 25% කින් අඩු කිරීම.
v. තරුණ, තරුණියන් මේ සඳහා ආකර්ෂනය කර ගැනීම.

### අත්‍යවශ්‍ය ආහාර භෝග නිෂ්පාදනය කිරීම

ඒකාබද්ධ ගොවිපළ පාලනයේ දී විවිධ භෝග වගා කිරීම සිදු කරයි. විශේෂයෙන් ම, වී වගා කිරීමේ දී ප්‍රධාන භෝගය වශයෙන් වී භෝගය ද අතුරු භෝග ලෙස නියර ආශ්‍රිතව සෝයා බෝංචි වැනි භෝගයක් වගා කළ හැකිය. මීට අමතරව එළවළු වගා කිරීමේ දී භෝග විවිධාංගිකරණය සිදු කරමින් විවිධ භෝග වගා කළ හැකිය. මෙමඟින් අත්‍යවශ්‍ය ආහාර භෝග නිෂ්පාදනය ඉහළ යන අතර ම ගොවීන්ගේ ආදායම ද ඉහළ නැංවේ. එමෙන් ම එක් භෝගයක් පමණක් වගා කර එයින් පාඩු සිදු වීමේ අවදානම ද අඩු වේ. දැනටත් නුවරඑළිය භෝග වගා රටාව සැලකීමේ දී මෙවැනි අවස්ථා සුලභව දැකිය හැකිය.

ලංකාදීප පුවත් පතේ වාර්තාවකට අනුව, (මහාචාර්ය රාජගුරු, 2004) ශ්‍රී ලංකාවේ වසරකට නිපදවෙන ඉවතලන භෝග කොටස් ප්‍රමාණය මෙට්‍රික් ටොන් මිලියන 5.8කි. මෙයින් මිලියන 4.5ක් ම ලැබෙන්නේ පිදුරු මඟිනි. ඉතිරිය අනෙකුත් භෝග මගින් ලැබේ. ඉවතලන ධාන්‍ය කොටස් ප්‍රමාණය මෙට්‍රික් ටොන් මිලියන 3කට ත් වඩා වැඩි බව එම වාර්තාවෙන් තවදුරටත් පැහැදිලි කර දී ඇත. මේ අනුව පෙනී යන්නේ මෙම ඉවතලන ශාක කොටස් හා ධාන්‍ය, කෘෂි කර්මාන්තය හා සත්ත්ව පාලනය සඳහා යොදාගත හැකි බවයි.

ලෝකයේ නව ප්‍රවණතාවය අනුව, කාබනික නිෂ්පාදන සඳහා ඉහළ ඉල්ලුමක් තිබේ. මෙම නිෂ්පාදන සෞඛ්‍ය සම්පන්න නිෂ්පාදන වේ. මේ නිසා, මේ ආකාරයට කාබනික වගාව සිදු කිරීම මඟින් රසායනික පොහොර සඳහා යන වියදම අඩු වන අතර ගොවිපළ ලාභාංශ වැඩි වේ.

මෙහි දී, දේශීය සාමාන්‍ය ගොවි ජනතාවට කාබනික පොහොර පමණක් යොදා සිදු කරන කාබනික ගොවිතැන තරමක් ප්‍රායෝගික නොවන ක්‍රියාවලියකි. එම නිසා රසායනික පොහොර අඩුවෙන් සහ කාබනික පොහොර වැඩියෙන් යොදා වගා කිරීමෙන් ආදායම මෙන් ම අස්වනු නෙළීමෙන් පසු කල් තබා ගැනීමේ කාලය ද, දීර්ඝ කරගත හැක. සමෝධානික/ඒකාබද්ධ

ගොවිපළ පාලනය තුළින් භෝග නිෂ්පාදනය ඉහළ නැංවිය හැකි අතර වර්තමානයේ මේ රටේ ප්‍රධාන ගැටලුවක් ව පවතින කිරි නිෂ්පාදනය ද ඉහළ නැංවිය හැකිය. මීට අමතරව ග්‍රාමීයව ගොවි පවුලකට අවශ්‍ය ප්‍රෝටීන අවශ්‍යතාවය ද, සත්ත්ව පාලනය සිදු කිරීම තුළින් සපුරාගත හැකිය. වාර්ෂිකව කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන මෙරටට ගෙන්වීමට විශාල විදේශ විනිමය ප්‍රමාණයක් වැය වේ. මෙය 2006 වර්ෂයේ රු. බිලියන 13 ක් ද ඉක්මවා ඇත. රට තුළ කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම මඟින් මෙම විශාල විදේශ විනිමය අපේ රටේ සංවර්ධනය සඳහා රට තුළම රඳවා ගත හැකිය. සත්ත්ව පාලනයේ දී, අනිවාර්යයෙන් ම ලබාදිය යුතු යැයි ගොවීන් සිතන සාන්ද්‍ර ආහාර ලබා දීම භෝග කොටස් හා අනෙකුත් ගොවිපළ ආශ්‍රිත නිෂ්පාදන ගවයන්ට ලබාදීම මඟින් කිරි නිෂ්පාදන පිරිවැය ද අඩු කර ගත හැකිය.

ග්‍රාමීයව මෙන් ම නාගරිකව ද තමන්ට හිමි සීමිත ඉඩකඩ උපරිම අයුරින් ප්‍රයෝජනයට ගෙන ගෙවතු වගාව කළ හැකි අතර නිවසින් ඉවතලන ද්‍රව්‍ය කොම්පෝස්ට් ලෙස සකසාගෙන වගා කරන භෝග සඳහා යෙදිය හැකිය. මෙහි දී මුළුතැන්ගෙය සඳහා අවශ්‍ය සමහර භෝග ගෘහනියන්ට ම වගා කර ගැනීමේ හැකියාව ඇත.

**ජනතාවගේ පරිභෝජන රටාව දියුණු කිරීම.**

"අපි වවමු - රට නගමු" යන තේමාව යටතේ ඒකාබද්ධ ගොවිපළ පාලනය සිදු කරමින් භෝග නිෂ්පාදන සහ සත්ත්ව නිෂ්පාදන ඉහළ නැංවීම තුළින් ගොවි පවුලේ ආදායම ඉහළ නැංවීම මඟින් ජනතාවගේ පරිභෝජන රටාව දියුණු කළ හැකිය.

මෙහි දී, විශේෂයෙන් ම තම ගොවිපළ ආශ්‍රිතව තම පෝෂණ අවශ්‍යතා සපුරා ගත හැකිය. වගාව තුළින් වී නිෂ්පාදනය ඉහල නංවා එමඟින් සහල් පරිභෝජනය වැඩි කළ හැකිය. මෙමඟින් ජනතාවගේ සෞඛ්‍ය අංශයෙන් පැන නඟින දුෂ්කරතා ද මඟහරවා ගත හැකිය. එමෙන් ම, ගෙවත්ත ආශ්‍රිතව අලුත් එලවළු, පලතුරු වගා කර ඒවා පාරිභෝජනය කිරීම තුළින් පාරිභෝජන රටාව දියුණු කිරීමේ හැකියාව පවතී. මීට අමතරව ඒකාබද්ධ ගොවිපළ පාලනයේ දී නිපදවන කිරි ග්‍රාමීය පාසල් ආශ්‍රිතව අලෙවි කිරීම මඟින් දියර කිරි පරිභෝජනය ද ඉහළ නැංවිය හැකිය.

**ආහාර ආනයනය සඳහා වාර්ෂිකව වැය වන විදේශ විනිමය පහත හෙළීම.**

"අපි වවමු - රට නගමු" වැඩසටහනේ මූලික පරමාර්ථයක් වන වාර්ෂිකව වැය වන විදේශ විනිමය ඉතිරි කර ගැනීම සමෝධානික ගොවිපළ පාලනය මඟින් මැනවින් ඉටු කර ගත හැකිය. මේ සඳහා ගොවීන් සාමූහිකවත්, තනි තනිවත් දැනුවත් කළ යුතුය. ඔවුන්ගේ වගා බිම් වලින් උපරිම ඵලදායිතාවයක් ලබා ගනිමින් රටේ කෘෂි නිෂ්පාදනය ඉහළ නැංවීම මඟින් ආහාර ආනයනය සඳහා යන මුදල අඩු කර ගත හැකිය. එමෙන් ම, සත්ත්ව නිෂ්පාදන හා කිරි නිෂ්පාදන ඉහළ දැමීම මඟින් විශාල විදේශ විනිමයක් ඉතිරි කර ගත හැකිය.

**කාබනික පොහොර භාවිතය දිරිගැන්වීම තුළින් රසායනික පොහොර භාවිතය අඩු කිරීම.**

ඉහතින් සාකච්ඡා කළ පරිදි වාර්ෂිකව ගොවීන්ට මෙන් ම රජයට ද රසායනික පොහොර සඳහා විශාල මුදල් ප්‍රමාණයක් වැය කළ යුතුව ඇත. මෙහිදී ඒකාබද්ධ ගොවිපළ පාලනයේ දී කාබනික පොහොර භාවිතා කිරීම සිදු කරයි. එමඟින් පොහොර සඳහා වැය වන මුදල අඩු කර ගත හැකි වේ.

උදා :- වී වගාව සඳහා කාබනික පොහොර යෙදීමේ දී අස්වනු නෙළීමෙන් පසු ලැබෙන පිදුරු කුඹුරට යෙදිය හැකිය. මීට අමතරව ග්ලිරිසීඩියා, ඉපිල් - ඉපිල්, සූරියකාන්ත, එරබදු වැනි ශාක වල කොළ යෙදිය හැක. කුකුළු පොහොර යෙදීමේ දී, දෙවන සී සෑමෙන් පසු අක්කරයකට කුකුළු පොහොර ටොන් 1ක් යෙදිය යුතුය. මීට අමතරව හොඳින් පිළිස්සු දහයියා අක්කරය ට කිලෝ ග්‍රෑම් 200ක් පමණ යෙදීමෙන් වී වගාව සඳහා අවශ්‍ය පොටෑසියම් ලබා දිය හැක.

කාබනික පොහොර යොදාගෙන රසායනික පොහොර ද යම් ප්‍රමාණයක් උපයෝගී කරගෙන සිදු කරන "ශ්‍රී" නැමැති වී වගා ක්‍රමය මගින් ද, අස්වැන්න වැඩි වී ඇති බව විවිධ පර්යේෂණ වාර්තා හා අනෙකුත් තොරතුරු අනුව පෙනී ගොස් ඇත.

**තරුණ තරුණියන් කෘෂිකර්මාන්තය සඳහා ආකර්ෂනය කරගැනීම.**

කාර්මීකරණය හා අනෙකුත් ආර්ථික ගැටළු නිසා වත්මන් තරුණ, තරුණියන් විශාල වශයෙන් ප්‍රධාන නගර ආශ්‍රිතව කේන්ද්‍රගත වී තම ජීවන වෘත්තිය සිදු කරගෙන යයි. සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තය සිදු කිරීමට ද නව පරම්පරාව මැලිකමක් දක්වයි. සමෝධානික ගොවිපළ පාලනය මගින් ලැබෙන ආදායම් ප්‍රායෝගිකව ග්‍රාමීයව තරුණ කණ්ඩායම් වලට අත්දකින්නට අවස්ථාවන් සලසා ඒ තුළින් තරුණ තරුණියන් කෘෂි කර්මාන්තය තුළට ඇද ගැනීමට ජාතික මට්ටමේ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය. එමගින්, තරුණ, තරුණියන් කෘෂි කර්මාන්තයට ආකර්ෂණය කර ගැනීමේ හැකියාව පවතී

මේ අනුව බලන කළ සමෝධානික ගොවිපළ පාලනය මගින් "අපි වවමු – රට නගමු" යන සංකල්පය වඩා ශක්තිමත් කොට ප්‍රායෝගික මට්ටමේ ජයග්‍රහණයක් කරා එළැඹිය හැකි වේ.

**සාගරිකා හිටිහාමු**

*පර්යේෂණ නිලධාරිණී*

**කෘෂි ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශය**
**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය**

---

**ඔබට අවශ්‍ය එළවළු හා පලතුරු ගෙවතු වගාව තුළින් නිපදවා ගැනීමෙන් ලබා ගතහැකි වාසි රාශියකි.**

- පවුලේ සාමාජිකයන්ට ප්‍රිය ජනක සමබර ආහාර වේලක් සකස් කර ගත හැකි වේ.
- සීමිත සාධකයක් වන භූමියෙන් උපරිම ප්‍රයෝජන ලබා ගත හැකි වේ.
- නිවසේ හා ගෙවත්තේ අපද්‍රව්‍ය නැවත නැවත භාවිතා කිරීමට හැකිවීම නිසා ගෙවත්තේ පස සාරවත් වන අතර පරිසරය පිරිසිදු වේ.
- ගෙවත්ත, කෘෂිකාර්මික දැනුම පරපුරෙන් පරපුරට ද, අසල්වැසියන්ට ද බෙදා හරින පාසලක් බඳුය.
- අවශ්‍ය විටෙකදී එල නෙළා ගැනීමට හැකි වේ.
- ශාක නිසා නිවස අවට සිසිල්, සුවපහසු අලංකාර පරිසරයක් ඇති වේ.
- එළවළු, පලතුරු, දැව, ඖෂධ හා කුළුබඩු ආදී ශාක මගින් ආර්ථික වාසි රැසක් ලැබේ.
- වස විසෙන් තොර, රස ගුණෙන් පිරි, පිරිසිදු, ආරක්ෂාකාරී අළුත් එළවළු හා පලතුරු පාරිභෝජනය කිරීමට හැකි වේ.
- පවුලේ සැමට තම තමන්ගේ විවේක කාලය නිවසේ සිටම ප්‍රයෝජනවත් ලෙස ගත කිරීමට අවස්ථාවක් සැලසේ.
- වෙළඳ පොළට යෑම් - ඊම් කිරීමට ගත වන කාලය හා වියදම ඉතිරි කර ගත හැකි වේ.
- ගතට ව්‍යායාමයකුත් සිතට සතුටකුත් ලැබේ.

**උපුටා ගැනීම්: ගෙවතු වගාව (කෘෂිකර්ම දෙපාර්තමේන්තුව)**